**පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය - 2019**

-----------------------------------------------------

පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 ඔක්තෝබර් 23 දින එළඹි මූල්‍ය ගිවිසුම් අංක 5678 සී (3) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන්හි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා සාධාරණ ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. මූල්‍ය ගිවිසුම අනුව, රු.මිලියන 7,250 කට සමාන එ.ජ.ඩො.මිලියන 50 ක් වූ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 පෙබරවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2021 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වය දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මාගේ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධිත පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුලුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිදුවීම් සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමක් ළඟා කර ගන්නේ යන්න ඇගයීම.

මාගේ විගණනයේ දී හඳුනාගත් සැලකිය යුතු විගණන නිරීක්ෂණ, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | නිර්දේශය |
|---|---|---|---|---|
| 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 371(2)(ආ) | අවස්ථාවන් 201 කදී ලබා දුන් වටිනාකම් රු.මිලියන 40.82 ක් වූ අග්‍රිම පියවීම සඳහා අදාල කාර්ය නිම වී මාස 02 ත් මාස 11 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. | අග්‍රිම අවභාවිතා වීමට ඉඩකඩ පවතී. | නොවැළැක්විය හැකි හේතුන් නිසා ඇතැම් පුහුණු වැඩසටහන් ප්‍රමාද විය හැකිය. | අග්‍රිම සම්බන්ධයෙන් පවතින මූල්‍ය පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 2 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන් ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ත කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයක් කෙරේ.

| සංරචකය | ක්‍රියාකාරකම් | 2019 දෙසැම්බර් 31 දිනට | | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණන නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | ළඟා කරගත් කාර්ය සාධනය | | | |
| පූර්ව ළමාවිය සංවර්ධන සේවාවන් ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ත කිරීම | නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | මධ්‍යස්ථාන 75 | නැත | පිරිවැය වැඩිවීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමට හැකියාව පවතී. | ප්‍රසම්පාදන විශේෂඥයෙකු නොමැති වීම හේතු වී ඇත. කෙසේ වෙතත් මෙම කාර්ය ක්‍රියාත්මක වෙමින් පවතී. 2021 මාර්තු අවසානය වන විට නිම කිරීමට අපේක්ෂිතය. | ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතියේ අරමුණු සහ ප්‍රතිලාභීන් සඳහා බලාපොරොත්තු වන ප්‍රතිලාභ ළඟා කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්මෙන් නියම කර ඇති ඉලක්ක |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ළඟා කර ගැනීමට ක්‍රියාකල යුතුයි. |
| ප්‍රතිලාභ නොලද හා අඩු ප්‍රතිලාභ සහිත ප්‍රදේශවල නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | මධ්‍යස්ථාන 12 | 01 | පිරිවැය වැඩිවීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමට හැකියාව පවතී. | සියළුම ඉදිකිරීම් 2020 අවසානය වන විට නිම කිරීමට අපේක්ෂිතය. | - එම - |
| පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය සහාය | මධ්‍යස්ථාන 1,700 | 92 | පිරිවැය වැඩිවීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමට හැකියාව පවතී. | මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නවීකරණය 2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රමාද වී ආරම්භ කිරීමට ප්‍රධාන හේතුව නම් දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රතිලාභී මධ්‍යස්ථාන ප්‍රමාද වී හඳුනා ගැනීමය. | - එම - |
| ළමා තක්සේරුකරණ වැඩසටහන් | වැඩසටහන් 1,540 | 834 | පිරිවැය වැඩිවීම හා ව්‍යාපෘති කාලය දීර්ඝ වීමට හැකියාව පවතී. | මෙම කාර්යය 2020 සහ 2021 වර්ෂවල නොකඩවා ක්‍රියාත්මක කරනු ලබන අතර, ව්‍යාපෘති කාලසීමාව අවසානයේ දී සැලසුම් කළ ඉලක්ක ළඟා කර ගනු ලැබේ. | - එම - |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ---------------------- | ---------- | --------------------- | ------------- |
| (i) | ව්‍යාපෘතිය රු.මිලියන 165.34 ක කොන්ත්‍රාත් සඳහා එළඹ තිබුණ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 ප්‍රකාරව ලංසු කැඳවනු ලැබූ අයිතමවල/ වැඩවල විස්තර, ලැබුණු සම්පූර්ණ ලංසු සංඛ්‍යාව, ජයග්‍රාහී ලංසුකරුගේ නම, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද මුදල යනාදී විස්තර උචිත මාධ්‍යයක පළ කර නොතිබුණි. | ටෙන්ඩර් පරිපාටිය කඩ කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිද භාවයට බලපෑම් ඇති විය හැකිය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතින අධික රාජකාරි නිසා මෙම ක්‍රියාව සම්පූර්ණ කිරීම ප්‍රමාද විය. | කොන්ත්‍රාත් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ii) | ගාල්ල කලේගාන මුල් ළමාවිය සංවර්ධන සම්පත් මධ්‍යස්ථානය නවීකරණය කිරීම සඳහා රු.මිලියන 10.42 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර වටිනාකම රු.මිලියන 1.33 ක් වූ කාර්යයන් 36 ක් ක්‍රියාත්මක කර නොමැති අතර, ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා රු.මිලියන 1.19 ක කාර්යයන් 15 ක් ක්‍රියාත්මක කර තිබුණි. | මිල විචලනයන් හා කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට ඉඩ තිබීම. | ලෝක බැංකු උපදෙස් මත කළමනාකරණය මෙම කාර්යයන් සිදු කර ඇත. | - ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී අවශ්‍යතාවය මනාව හඳුනා ගත යුතුය.<br>- ඇස්තමේන්තු ගත වටිනාකමට කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුය. |
| (iii) | ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම්වලට අදාල කොන්ත්‍රාත්වලදී කොන්ත්‍රාත් ගිවිසුම් මනාව ක්‍රියාත්මක නොකිරීම, ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳව වාර්තා ව්‍යාපෘතියට ඉදිරිපත් නොකිරීම හා ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා මුදල් තැන්පත් කළ දිනය හා ඉදිකිරීම් ආරම්භ කළ දිනය අතර ප්‍රමාදයන් සිදු වී තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම්වල කොන්දේසි කඩ වීම. | කළමනාකරණ ප්‍රතිචාර දක්වා නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම් මනාව ක්‍රියාත්මක කළ යුතුය. |
| (iv) | ගෘහ භාණ්ඩ කට්ටල 1,500 ක් රු.මිලියන 138 ක වටිනාකමට සපයා ගැනීම හා ප්‍රවාහනය කර ගැනීම සඳහා භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් මඟින් මිල ගණන් කැඳවා තිබුණි. ලංසු ඇපකරය වලංගු විය යුතු දිනය ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන පුවත්පත්වල පිළිවෙලින් 29 නොවැම්බර් 2018, 11 ජනවාරි 2019 සහ 11 ජනවාරි 2018 ලෙස | ව්‍යාපෘතිය අලාභ සිදුවීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ හා | කළමනාකරණ ප්‍රතිචාර දක්වා නොමැත. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය නිවැරදිව සිදු කිරීම හා ලංසු ලියවිලිවල ලංසුකරුවන්ට නිවැරදි තොරතුරු ලබා දිය යුතුය. |

| | |
|---|---|
| පල කර තිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම ලංසු ලියකියවිලිවල එම දිනය 2019 ජනවාරි 11 හා 2019 ජනවාරි 25 ලෙස සඳහන් කර තිබුණි. 2019 ජනවාරි 11 දිනට වලංගු ලංසු ඇපකර ඉදිරිපත් කර අඩුම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනෙකුගේ ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. ලංසු ඇපකරුවල වලංගු දිනය වැරදි ලෙස පුවත්පත්වල හා ලංසු ලියවිලිවල ඇතුළත් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය රු.මිලියන 7.17 ක අලාභයක් සිදු වී තිබුණි. | සමාන අවස්ථා අහිමි වීම. |